# රාජ්‍ය මූල්‍ය කටයුතු*

1987 අයවැය හිඟය (දීමනාවන්ට පෙර) රුපියල් දශ ලක්ෂ 20,904 ක් ලෙස තාවකාලික දත්තයන් පෙන්නුම් කරනු ලබන අතර, 1986 දී එය රුපියල් දශ ලක්ෂ 21,956 ක් විය. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අයවැය හිඟය 1986 දී සියයට 12.2 සිට 1987 දී සියයට 10.6 දක්වා අඩු විය. මෙය අයවැය තත්ත්වයෙහි සතුටුදායක ප්‍රවනතාවයකි.

1987 අයවැය පරතරයේ අඩු වීම හේතු කීපයක ප්‍රතිඵලයකි. පළමුව, ආදායම් බදු සහ සාමාන්‍ය විකුණුම් හා පිරිවැටුම් බදු ආදායමේ අඩු වර්ධනයක් තිබියදී වුවද, ජාත්‍යන්තර වෙළෙඳාම පදනම් වූ බදු වලින් හා බදු නොවන ආදායම් ඉහළ යෑමේ හේතුවෙන් රජයේ මුළු ආදායමෙහි වර්ධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වීමය. දෙවනුව, මෑත වර්ෂවලදී අයවැයෙහි අසමතුලිතතාව කෙරෙහි බලපෑ ප්‍රධාන මූලයක් වූ අත්තිකාරම් ගිණුම් කටයුතු මෙම වසරේදී අතිරික්තයක් උපදවමින් සැළකිය යුතු වැඩි දියුණු වීමක් පෙන්වීය. තෙවනුව, ආරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය පරිපූරක වියදම්, අනෙකුත් අමාත්‍යාංශයන්හි ප්‍රාග්ධන වියදම් සඳහා වූ රුපියල් ප්‍රතිපාදනයන්ගේ සියයට 11 ක කපා හැරීමක් මගින් ලබා ගනු ලැබිනි. මෙම සිදුවීම් 1987 වසරේදී අයවැය හිඟය අඩු කිරීම සඳහා බෙහෙවින් උපකාරී විය.

සමස්ත අයවැය හිඟය අඩු වුවද, 1987 අයවැය ක්‍රියාකාරිත්වය දූනට අයවැය ක්‍රමය ක්‍රියාත්මක වන සීමාවන් තවදුරටත් පිළිබිඹු කෙරිනි. නිදසුනක් වශයෙන් වර්තන ගිණුමේ අතිරික්තය සුළු වශයෙන් වැඩි වුවද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1986 සියයට 1.8 සිට 1987 සියයට 1.7 දක්වා පහත වැටුණි. මේ අතර, විදේශීය සහ දේශීය බැංකු නොවන මූලයන්ගෙන් පියවූ පසු ඇති වූ පරතරය රුපියල් දශ ලක්ෂ 3,541 ක් විය. එය බැංකු ක්‍රමයෙන් ලබා ගත් සම්පත් මගින් පියවනු ලැබිනි. 1987 දී දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව බැංකු ක්‍රමයෙන් ලබා ගත් සම්පත් උපයෝජනය සියයට 1.8 ක් විය. බැංකු ණය ගැනීම් මත නොකඩවා රඳා පැවතීම සහ වර්තන ගිණුම් අතිරික්තය අඩු වීම තුළින් පෙන්නුම් කරනුයේ ලබා ගත හැකි සම්පත් ප්‍රමාණයට සරිලන සේ රජයේ වියදම අඩු කිරීම පිණිස ප්‍රයත්නයන් තවදුරටත් දැරීමේ අවශ්‍යතාවයයි.

## අයවැය තත්ත්වය

රුපියල් දශ ලක්ෂ 42,155 ක් වූ 1987 රජයේ ආදායම පසුගිය වසරට වඩා සියයට 13 ක වැඩි වීමක් සටහන් කළ අතර, රුපියල් දශ ලක්ෂ 38,713 ක් වූ වර්තන වියදම සියයට 14 ක වර්ධනයක් වාර්තා කරනු ලැබිනි. මේ අනුව 1987 අයවැයෙහි වර්තන ගිණුම් අතිරික්තය රුපියල් දශ ලක්ෂ

---

* මෙම කොටසෙහි දෙනු ලබන දත්තයන් තාවකාලික වේ. ප්‍රතිශෝධිත දත්ත 1987 ආර්ථික විවරණයෙහි පළ කරනු ලැබේ.

ආර්ථික විග්‍රහයන් කිරීමේ පහසුව පිණිස මෙහි දක්වා ඇති දත්තයන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත් පොතෙහි සපයා ඇති උපදෙස්වලට අනුකූලව ඉදිරිපත් කොට ඇත. මෙම කොටසෙහි දක්වා ඇති දත්තයන් ඉකුත් වර්ෂයන්හි වාර්ෂික වාර්තාවල ඉදිරිපත් කර ඇති දත්තයන්ගෙන් වෙනස් වන නමුදු, රජයේ මධ්‍යකාලීන ප්‍රතිපත්ති රාමුවෙහි ඉදිරිපත් කර ඇති දත්තයන් හා සැසඳේ. ආර්ථික වර්ගීකරණය අනුව ආපසු ගෙවීමක් නොකෙරෙන සියළුම ලැබීම් සහ වසර තුළදී කරන ලද ආපසු ලැබීම් අඩුකර රජයේ ආදායම පෙන්වනු ලබන අතර, ආපසු ලැබීමක් සිදු නොවන රජයේ ගෙවීම්, වියදමෙහි ඇතුළත් වේ. මේ අනුව ආනයන බදු ප්‍රතිදාන, වෙළෙඳ ව්‍යවසායයන්හි දළ ලැබීම් හා ගෙවීම් සහ ඒකාබද්ධ ආයෝජන අරමුදලෙන් කරන පොළී ගෙවීම් රජයේ ආදායමෙන් සහ වියදමෙන් ඉවත් කෙරේ. වෙළෙඳ ව්‍යවසායයන්හි ලාභ ආදායමෙහි ඇතුළත් වන අතර, අලාභ වර්තන වියදමෙහි ඇතුළත් වේ. ආරක්ෂක වියදම්, වර්තන වියදම් ලෙස සළකනු ලැබේ. ප්‍රාග්ධන වියදම්, ණය ආපසු ගෙවීම් අඩුකොට පෙන්නුම් කෙරේ. වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (−) රජයේ ආදායම හා වර්තන වියදම අතර වෙනසින් පෙන්වනු ලබයි. රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත් පොතෙහි අය වැය හිඟය ගණනය කිරීමේදී ප්‍රදානයන්, ආදායම සමග වර්ග කෙරේ. එම ගණුදෙනු මගින් අය වැය හිඟය මූල්‍යකරණය කිරීමට වඩා අයවැය හිඟය අඩු කිරීමක් සිදු වේය යන අර්ථය මත මෙවැන්නක් සිදු කෙරේ. ජාතික ආදායම් ගිණුම් සහ ගෙවුම් ශේෂයන්හි අයවැය දත්තයන් යොද ගන්නා ආකාරයද මෙම ගිණුම් තැබීමේ ක්‍රමය හා අනුකූල වේ. කෙසේ වුවද, විග්‍රහාත්මක වෙනස්කම් විවිධ බැවින් අයවැය හිඟය ප්‍රදනයන්ට පෙර සහ ප්‍රදනයන්ට පසුව යනුවෙන් වෙන් වශයෙන් මෙම වාර්තාවෙහි පෙන්නුම් කෙරේ. පොදු කටයුතු සඳහා රජයේ ණය දීම් වලින් ආපසු ලැබීම් අඩු කළ විට ඇති වන ප්‍රතිඵලය 'ණය ආපසු ලැබීම් අඩු කළ විට ණය දීම්' යනුවෙන් හැඳින් වේ. මෙය රජයේ මුළු වියදමෙන් කොටසක් වශයෙන් සැලකේ.

3,442 ක් විය. 1986 වර්ෂයේදී වර්තන ගිණුම් අතිරික්තය රුපියල් දශ ලක්ෂ 3,272 ක් විය. රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් 1986 දී සියයට 20.8 සිට 1987 දී සියයට 21.4 දක්වා වැඩි වූ අතර, වර්තන වියදමද සියයට 18.9 සිට සියයට 19.7 දක්වා ඉහළ නැඟුණි. කෙසේ වුවද, වර්තන ගිණුම් අතිරික්තය/දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය 1986 දී සියයට 1.8 සිට 1987 දී සියයට 1.7 දක්වා පහත වැටුණි. වසර තුළදී ආදායමෙහි වැඩි වීමක් ඇති වුවද, රාජ්‍ය ණය පොළී ගෙවීම් සහ ආරක්ෂක වියදම් වැඩිවීම නිසා 1987 රජයේ ඉතිරි කිරීම් අඩු විය. පොළී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 1986 දී සියයට 4.9 සිට 1987 දී සියයට 5.2 දක්වා වැඩි වූ අතර, ආරක්ෂක කටයුතු ආශ්‍රිත වියදම්/දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය සියයට 3.5 සිට සියයට 4.8 දක්වා වැඩි විය.

1987 වසරේදී රුපියල් දශ ලක්ෂ 46,679 ක් වූ මුළු ආදායම සහ දීමනා, සියයට 14 ක වර්ධනයක් වාර්තා කරනු ලැබින. ප්‍රාග්ධන වියදමෙහි සහ ණය ආපසු ලැබීම් අඩුකළ පසු ණය දීම් සියයට 4 ක අඩු වීමක් පෙන්නුම් කළද, මුළු වියදම සියයට 7 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 63,059 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වසර අවසානයේදී අයවැය හිඟය (දීමනා ඇතුළත්ව) රුපියල් දශ ලක්ෂ 16,380 ක් වූ අතර, එය පසුගිය වසරට වඩා අඩු අයවැය හිඟයක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් ගත් කළ අයවැය හිඟය 1986 සියයට 10.1 සිට 1987 සියයට 8.3 දක්වා පහත වැටුණි. අයවැය කටයුතු සඳහා විදේශ දීමනා ප්‍රයෝජනයට ගැනීම් රුපියල් දශ ලක්ෂ 4,524 ක් වූ අතර, එය සියයට 21 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මේ අනුව විදේශ ප්‍රදානයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1986 වර්ෂයේ සියයට 2.1 සිට 1987 වර්ෂයේ සියයට 2.3 දක්වා වැඩි විය. අයවැය කටයුතු සඳහා විදේශ දීමනා උපයෝජනය වැඩිවුවද, දීමනාවලට පෙර අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 20,904 ක්ව සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව දීමනාවලට පෙර අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1986 සියයට 12.2 සිට 1987 සියයට 10.6 දක්වා අඩුවිය.

අයවැය හිඟය (දීමනාවලට පසුව) පියවීමේදී රුපියල් දශ ලක්ෂ 5,716 ක ප්‍රමාණයක් විදේශීය ණය මගින් ලබා ගන්නා ලදී. මෙය පසුගිය වසරේ ලබා ගත් විදේශීය ණය ප්‍රමාණයට වඩා සියයට 37 කින් අඩු වූ අතර, මෙම අඩු වීම නිසා 1987 දී අයවැය හිඟය පියවීමේ ප්‍රභවයක් සේ විදේශීය ණයෙහි ඇති සාපේක්ෂ වැදගත්කම අඩු විය. මෑත වර්ෂවලදී අයවැය හිඟයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් පියවීම සඳහා යොදාගත් විදේශීය ණය 1987 දී පියවනු ලැබුයේ හිඟයෙන් තුනෙන් එකක ප්‍රමාණයක් පමණි. 1987 දී විදේශීය ණය දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් ගත් කළ සියයට 3 ක් පමණ වූ අතර, මෑත වර්ෂවලදී එය සියයට 4–5 ක අනුපාතිකයක්ව පැවතින. විදේශ සම්පත් අඩුවෙන් උපයෝජනය කිරීමෙන් පෙන්වනුයේ අයවැය හිඟය සතුටුදායක මට්ටමකට ගැනීමට රජය දරන උත්සාහයයි.

1987 දී හිඟය පියවීම සඳහා දේශීය සම්පත් භාවිතය රුපියල් දශ ලක්ෂ 10,664 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 17 ක වැඩි වීමකි. කෙසේ වුවද, බැංකු නොවන වෙළෙඳපොල මූලයන්ගෙන් ලබා ගත් සම්පත් ප්‍රමාණය සියයට 5 ක අඩු වීමක් සටහන් කරමින් රුපියල් දශ ලක්ෂ 6,399 ක් විය. වෙළෙඳපොල නොවන මූලයන් රුපියල් දශ ලක්ෂ 724 ක් සපයන ලද අතර, බැංකු මූලයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 3,541 ක් ලබා ගන්නා ලදී. මේ අනුව බැංකු ක්‍රමයෙන් ලබා ගත් සම්පත් උපයෝජනය 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8 ක් වූ අතර, 1986 දී එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7 ක් විය.

පසුගිය සත් වසරක සංසන්දනාත්මක දත්ත සමග 1987 අයවැය කටයුතු පිළිබඳ සාරාංශයක් සංඛ්‍යා සටහන් 1.41 හි දෙනු ලැබේ.

## 1 . 41 සංඛ්‍යා සටහන

## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1981 | 1982 | 1983 | 1984 | 1985 | 1986 | 1987 අනුමත කළ ඇස්තමේන්තු | 1987 තාවකාලික | 1988 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම සහ දීමනා** .. | **17,496** | **19,586** | **26,790** | **37,354** | **39,556** | **40,991** | **45,626** | **46,679** | **51,225** |
| **මුළු ආදායම** .. | **14,775** | **16,210** | **23,317** | **34,061** | **36,249** | **37,238** | **41,531** | **42,155** | **46,225** |
| බදු ආදායම .. | 13,696 | 14,737 | 19,912 | 29,939 | 30,442 | 31,272 | 35,704 | 35,127 | 39,785 |
| බදු නොවන ආදායම .. | 1,079 | 1,473 | 3,405 | 4,122 | 5,807 | 5,966 | 5,827 | 7,028 | 6,440 |
| **දීමනා** .. | **2,721** | **3,376** | **3,473** | **3,293** | **3,307** | **3,753** | **4,095** | **4,524** | **5,000** |
| **වියදම සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම** .. | **28,014** | **33,512** | **39,637** | **47,837** | **55,234** | **59,193** | **62,323** | **63,059** | **72,534** |
| වර්තන .. | 14,649 | 18,341 | 22,002 | 24,630 | 32,645 | 33,966 | 36,953 | 38,713 | 40,548 |
| ප්‍රාග්ධන .. | 11,252 | 15,427 | 15,863 | 19,915 | 21,530 | 23,236 | 23,351 | 22,969 | 27,017 |
| ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම .. | 2,113 | – 256 | 1,772 | 3,292 | 1,059 | 1,991 | 2,019 | 1,377 | 4,969 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය(–)** .. | **126** | **– 2,131** | **1,315** | **9,431** | **3,604** | **3,272** | **4,578** | **3,442** | **5,677** |
| **අයවැය හිඟය (දීමනාවලට පෙර)** .. | **–13,239** | **–17,302** | **–16,320** | **–13,776** | **–18,985** | **–21,956** | **–20,792** | **–20,904** | **–26,309** |
| **අයවැය හිඟය (දීමනාවලට පසු)** .. | **–10,518** | **–13,926** | **–12,847** | **–10,483** | **–15,678** | **–18,203** | **–16,697** | **–16,380** | **–21,309** |
| **පියවීම** .. | **10,517** | **13,927** | **12,845** | **10,483** | **15,678** | **18,204** | **16,697** | **16,380** | **21,309** |
| **විදේශීය ණය ගැනීම්** .. | **4,880** | **4,744** | **6,312** | **6,492** | **7,109** | **9,061** | **6,649** | **5,716** | **12,520** |
| **දේශීය ණය ගැනීම්** .. | **5,637** | **9,183** | **6,533** | **3,991** | **8,569** | **9,143** | **10,048** | **10,664** | **8,789** |
| වෙළෙඳපොල නොවන ණය ගැනීම් .. | 344 | 1,487 | 1,977 | 951 | – 1,801 | – 669 | — | 724 | — |
| වෙළෙඳපොල ණය ගැනීම් .. | 5,293 | 7,696 | 4,556 | 3,040 | 10,370 | 9,812 | 10,048 | 9,941 | 8,789 |
| බැංකු නොවන .. | 1,446 | 4,020 | 4,082 | 5,135 | 5,659 | 6,765 | 6,578 | 6,399 | 6,213 |
| බැංකු .. | 3,847 | 3,676 | 474 | – 2,095 | 4,711 | 3,047 | 3,470 | 3,541 | 2,576 |

(අනෙක් පිට හා සම්බන්ධයි.)


## 1 . 41 සංඛ්‍යා සටහන හා සම්බන්ධයි

### දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1981 | 1982 | 1983 | 1984 | 1985 | 1986 | 1987 අනුමත කළ ඇස්තමේන්තු | 1987 තාවකාලික | 1988 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම සහ දීමනා** .. | **20·6** | **19·8** | **22·0** | **24·3** | **24·4** | **22·8** | **22·3** | **23·7** | **22·6** |
| **මුළු ආදායම** .. | **17·4** | **16·3** | **19·2** | **22·2** | **22·3** | **20·8** | **20·3** | **21·4** | **20·4** |
| බදු ආදායම .. | 16·1 | 14·9 | 16·4 | 19·5 | 18·7 | 17·4 | 17·4 | 17·9 | 17·6 |
| බදු නොවන ආදායම .. | 1·3 | 1·5 | 2·8 | 2·7 | 3·6 | 3·3 | 2·8 | 3·6 | 2·8 |
| **දීමනා** .. | **3·2** | **3·4** | **2·9** | **2·1** | **2·0** | **2·1** | **2·0** | **2·3** | **2·2** |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම්** .. | **33·0** | **33·8** | **32·6** | **31·1** | **34·0** | **33·0** | **30·4** | **32·1** | **32·0** |
| වර්තන .. | 17·2 | 18·5 | 18·1 | 16·0 | 20·1 | 18·9 | 18·0 | 19·7 | 17·9 |
| ප්‍රාග්ධන .. | 13·2 | 15·6 | 13·0 | 13·0 | 13·3 | 13·0 | 11·4 | 11·7 | 11·9 |
| ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් .. | 2·5 | – 0·3 | 1·5 | 2·1 | 0·7 | 1·1 | 1·0 | 0·7 | 2·2 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය ( – )** .. | **0·1** | **– 2·1** | **1·1** | **6·1** | **2·2** | **1·8** | **2·2** | **1·7** | **2·5** |
| **අයවැය හිඟය (දීමනාවලට පෙර)** .. | **– 15·6** | **– 17·4** | **– 13·4** | **– 9·0** | **– 11·7** | **– 12·2** | **– 10·1** | **– 10·6** | **– 11·6** |
| **අයවැය හිඟය (දීමනාවලට පසු)** .. | **– 12·4** | **– 14·0** | **– 10·6** | **– 6·8** | **– 9·7** | **– 10·1** | **– 8·1** | **– 8·3** | **– 9·4** |
| **පියවීම** .. | **12·4** | **14·0** | **10·6** | **6·8** | **9·7** | **10·1** | **8·1** | **8·3** | **9·4** |
| **විදේශීය ණය ගැනීම්** .. | **5·7** | **4·8** | **5·2** | **4·2** | **4·4** | **5·1** | **3·2** | **2·9** | **5·5** |
| **දේශීය ණය ගැනීම්** .. | **6·6** | **9·3** | **5·4** | **2·6** | **5·3** | **5·1** | **4·9** | **5·4** | **3·9** |
| වෙළෙඳපොළ නොවන .. | 0·4 | 1·5 | 1·6 | 0·6 | – 1·1 | – 0·4 | — | 0·4 | — |
| වෙළෙඳපොළ .. | 6·2 | 7·8 | 3·7 | 2·0 | 6·4 | 5·5 | 4·9 | 5·1 | 3·9 |
| බැංකු නොවන .. | 1·7 | 4·1 | 3·4 | 3·3 | 3·5 | 3·8 | 3·2 | 3·3 | 2·7 |
| බැංකු .. | 4·5 | 3·7 | 0·4 | – 1·4 | 2·9 | 1·7 | 1·7 | 1·8 | 1·1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්




ශ්‍රී ලංකා මහ බැංකුව.

ආදායම

1987 වර්ෂයේදී රජයේ ආදායම රුපියල් දශ ලක්ෂ 42,155 ක් විය. මෙය පසුගිය වසරේ ආදායම වූ රුපියල් දශ ලක්ෂ 37,238 ට වඩා සියයට 13 ක වැඩි වීමකි. 1987 වර්ෂයේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි ඇතිවූ පසුබෑස්ම හා සලකා බැලීමේදී මුළු ආදායමෙහි ඇතිවූ සියයට 13 ක වර්ධනය දිරිගන්වන සුළුය. ආදායම/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය සහ බදු/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය යන දෙකෙහිම වැඩි දියුණු වීම මගින් පිළිබිඹු වනුයේ ආදායමේ වර්ධන වේගය සමස්ත ආර්ථික වර්ධන වේගයට බෙහෙවින් සරිලන ප්‍රමාණයකින් පැවතීමය. පෙර වර්ෂයේදී මෙන්ම, 1987 වර්ෂයේදී බදු ආදායම මුළු ආදායමින් සියයට 83 කට දායක විය. දේශීය භාණ්ඩ හා සේවා මත වූ බදු වලින් 1987 වර්ෂයේදී ලැබූ ආදායම මුළු බදු ආදායමෙන් සියයට 44 ක් වූ අතර, එය 1986 වසරේ සියයට 47 ක් විය. මේ අතර විදේශ වෙළෙඳාම පදනම් කර ගත් බදු වලින් වූ දායකත්වය 1986 වසරේ සියයට 35 සිට 1987 වසරේ සියයට 37 දක්වා වැඩි විය. අපනයන බදු ප්‍රමාණයෙන් මුළු බදු ආදායමට ඇති වූ දායකත්වයේ සුළු වැඩි වීමක් පෙන්නුම් කළ අතර, ආදායම් බදු වලින් වූ දායකත්වය 1986 වර්ෂයේදී සියයට 15 සිට 1987 වර්ෂයේදී සියයට 14 දක්වා පහත වැටුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අතිරික්තය, පොළී ආදායම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් වූ විශේෂ අයකිරීම 1987 වර්ෂයේ බදු නොවන ආදායම්හි ප්‍රමුඛත්වයක් ගනු ලැබිනි. මෙම මූලයන්ගෙන් ලද ආදායම 1987 වර්ෂයේ ලැබූ බදු නොවන ආදායමෙන් ආසන්න වශයෙන් සියයට 90 ක් පමණ විය.

1987 භාණ්ඩ හා සේවා මත වූ දේශීය බදු ආදායම රුපියල් දශ ලක්ෂ 15,667 ක් වූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 6 කින් වැඩි වීමකි. 1987 වසරේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මධ්‍යයේ වුවද, භාණ්ඩ හා සේවා මත වූ දේශීය බදු ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සුරා බදු අනුපාත වැඩි කිරීම සහ නිෂ්පාදන කර්මාන්තයන්හි ඉහළ නිෂ්පාදන මට්ටමක් පැවතීමත්ය. භාණ්ඩ හා සේවා මත වූ දේශීය බදු ආදායමෙන් තුනෙන් දෙකක් වූ පිරිවැටුම් බදු ආදායම සියයට 5 කින් වැඩි විය. එහෙත් පසුගිය වසරේදී පිරිවැටුම් බදු වෙතින් සියයට 1 ක ආන්තික අඩු වීමක් දක්නට ලැබිනි. නිෂ්පාදන කටයුතු මත වූ පිරිවැටුම් බදු ආදායම සියයට 12 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, ආනයන පිරිවැටුම් බදු සියයට 2 කින් ඉහළ නැගුණි. කෙසේ වුවද, නිෂ්පාදනමය නොවන කටයුතු වලින් ලැබූ පිරිවැටුම් බදු ප්‍රමාණය බොහෝදුරට ඉකුත් වසරේ මට්ටම හා සමානව පැවතුණි.

1987 දී සුරා බදු වලින් ලත් ලැබීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,716 ක් වූ අතර, එය දේශීය භාණ්ඩ හා සේවා මත වූ බදු වලින් සියයට 30 ක් විය. මත්පැන් මත වූ සුරා බදු ආදායම සියයට 11 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,644 ක් වූ අතර, රුපියල් දශ ලක්ෂ 3,071 ක් වූ දුම්කොළ බදු ආදායම සියයට 5 ක ඉහළ නැගීමක් පිළිබිඹු කෙරිනි. මෙකී ආදායම්වල වැඩි වීමට හේතු වූයේ 1986 නොවැම්බර් මාසයේදී කළ බදු අනුපාතිකයන් වැඩිකිරීමය. මෝටර් රථ වාහන බලපත්‍ර ගාස්තු ඉහළ යාම නිසා බලපත්‍ර ගාස්තු ආදායම සියයට 19 කින් ඉහළ නැගුණි.

1987 වසරේදී ජාත්‍යන්තර වෙළෙඳාම පදනම් කර ගත් බදු ආදායම රුපියල් දශ ලක්ෂ 12,983 ක් විය. ආනයන බදු ආදායම රුපියල් දශ ලක්ෂ 11,059 ක්වූ අතර, එය සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබිනි. මෙයට විශාල වශයෙන් හේතු වූයේ සීනි, ඛනිජ තෙල් වැනි ද්‍රව්‍යවල ආනයන ප්‍රමාණ වැඩි වීම සහ ඇතැම් භාණ්ඩයන්හි ඒකක වටිනාකම වැඩි වීමයි. මේ අනුව සාමාන්‍ය ආනයන බදු අනුපාතිකය 1986 දී සියයට 17 සිට 1987 දී සියයට 18 දක්වා වැඩි විය. 1987 දී අපනයන බදු සියයට 18 කින් ඉහළ ගිය අතර එම ආදායම, ජාත්‍යන්තර වෙළෙඳාම මත වූ බදු වලින් සියයට 15 කට දායක විය. තේ අපනයන මත වූ විශේෂිත බදු ආදායම සියයට 5 කින් අඩු වූ අතර පොල් අපනයන බදු සියයට 36 කින් පහත වැටිනි. මෙයට

ප්‍රධාන හේතුව 1987 දී තේ සහ පොල් යන දෙකෙහිම අපනයන ප්‍රමාණය අඩු වීමය. කෙසේ වුවද, සතුටුදායක මිළ ගණන් නිසා වසර තුළදී වට්නාකම් අනුව අය කෙරෙන තේ සහ රබර් බදු ආදායම් සැළකිය යුතු වැඩි දියුණු වීමක් පෙන්නුම් කරනු ලැබින.

යන්ත්‍රාගාර, යන්ත්‍ර, උපකරණ සහ වාණිජමය ගොඩනැගිලි සඳහා දෙනු ලබන ක්ෂය වීම් දීමනා අනුපාතිකයේ වැඩි වීමක් සහ කෘෂිකාර්මික නිෂ්පාදනයේ අඩු වීමක් තිබියදී වුවද, සාමූහික සහ පෞද්ගලික බදු ආදායම වූ රුපියල් දශ ලක්ෂ 4,909 සියයට 3 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මීට ප්‍රතිමුඛව ඉකුත් වසරේදී මෙම ආදායම් සියයට 14 කින් පහත වැටුණි. නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වය යහපත් වීම වසර තුළදී ආදායම් බදු ඉහළ යාමට ප්‍රධාන හේතුව විය.

1987 දී බදු නොවන ආදායම රුපියල් දශ ලක්ෂ 7,028 ක් වූ අතර, පසුගිය වසරේදී එය රුපියල් දශ ලක්ෂ 5,966 ක් විය. බදු නොවන ආදායමින් තුනෙන් දෙකකට දායකත්වය දරමින් රජයේ දේපොළ මත වූ ආදායම රුපියල් දශ ලක්ෂ 4,541 ක් විය. මෙම ආදායම 1986 ට වඩා 1987 දී සියයට 4 කින් අඩු විය. මෙම අඩුවීම සිදුවූයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අතිරික්තයේ සැළකිය යුතු වැඩි වීමක් තිබියදීය. විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අතිරික්තය සියයට 50 කින් පමණ ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ විදේශ විදුලි සංදේශ සේවා පහසුකම් භාවිතය වැඩි වීමයි.

පසුගිය සත් වසරක සංසන්දනාත්මක දත්ත සමග 1987 වර්ෂය සඳහා වූ රජයේ ආදායම් පිළිබඳ සංඛ්‍යාත්මක සම්පිණ්ඩනයක් සංඛ්‍යා සටහන් 1.42 හි දක්වනු ලැබේ.

**වර්තන වියදම**

1987 රුපියල් දශ ලක්ෂ 38,713 ක් වූ මුළු වර්තන වියදම ඉකුත් වසරට වඩා සියයට 14 ක වැඩි වීමක් වාර්තා කරනු ලැබින. මේ අනුව, වර්තන වියදම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය 1986 සියයට 18.9 සිට 1987 සියයට 19.7 දක්වා ඉහළ නැගුණි. භාණ්ඩ හා සේවා සඳහා වූ රුපියල් දශ ලක්ෂ 17,640 ක වියදම 1987 වර්තන වියදමෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් විය. පසුගිය වසරේ මෙන්ම රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් වර්තන වියදමෙන් සියයට 26 ක් විය. රාජ්‍ය සංස්ථා, ආයතන සහ කුටුම්භයන් සඳහා කරන ලද මුළු වර්තන පැවරුම් ප්‍රමාණය 1987 මුළු වර්තන වියදමෙන් සියයට 28 ක් විය.

භාණ්ඩ හා සේවා වියදමෙහි ඇතුළත් රුපියල් දශ ලක්ෂ 7,986 ක් වූ රජයේ සේවකයින්ගේ වැටුප් හා වේතන වියදම 1987 මුළු වර්තන වියදමෙන් සියයට 21 ක් පමණ විය. 1986 දී මෙම කොටස සියයට 24 කි. ආසන්න වශයෙන් වැටුප් හා වේතන වලින් හතරෙන් තුනක ප්‍රමාණයක් සිවිල් පරිපාලනය සඳහා විය. 1987 දී වැටුප් හා වේතන සඳහා වූ වියදමේ වැඩි වීමක් සිදු නොවුවද, ගමන් වියදම්, කුලී, විදුලිය හා පණිවුඩ ගාස්තු, ද්‍රව්‍ය මිළදී ගැනීම, කාර්යාලයීය සැපයුම්, ආරක්ෂක භාණ්ඩ හා නඩත්තු වියදම් ආදිය ඇතුළත් වන වෙනත් භාණ්ඩ හා සේවා වියදම් රුපියල් දශ ලක්ෂ 9,654 ක් වූ අතර, එය සියයට 35 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. මෙයට බෙහෙවින් හේතු වූයේ ආරක්ෂක ආශ්‍රිත වියදම් විශාල ලෙස වැඩි වීමය.

රුපියල් දශ ලක්ෂ 10,914 ක් වූ වර්තන පැවරුම් සියයට 9 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, පසුගිය වසරේ එය සියයට 13 කින් වැඩිවිය. විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 3,185 වර්තන පැවරුම් වලින් සියයට 30 කට ආසන්න වූ අතර, එය සියයට 7 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. අඩු ආදායම් ලබන පවුල් සඳහා වූ ඍජු ආදායම් පැවරීමක් වන ආහාර හා භූමිතෙල් මුද්දර සඳහා වූ රුපියල් දශ ලක්ෂ 1,885 ක වියදම සියයට 5 කින් වැඩි විය. මේ අතර, පාසැල් යන සිසුන්ට උපකාර කිරීම පිණිස සැලසුම් කර ඇති දිවා ආහාර, වාර ප්‍රවේශ පත්‍ර හා පාසැල්පොත් නොමිලේ සපයා දීමට දැරූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 315 ක් විය.

## 1 . 42 සංඛ්‍යා සටහන

### රජයේ ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1981 | 1982 | 1983 | 1984 | 1985 | 1986 | 1987 අනුමත කළ ඇස්තමේන්තු | 1987 තාවකාලික | 1988 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **13,696** | **14,737** | **19,912** | **29,939** | **30,442** | **31,272** | **35,704** | **35,127** | **39,785** |
| **ආදායම් බදු** | **2,029** | **2,923** | **3,366** | **5,480** | **5,586** | **4,787** | **5,105** | **4,909** | **4,865** |
| පුද්ගලික | 570 | 808 | 891 | 1,760 | 1,424 | 1,513 | 1,635 | 1,580 | 1,440 |
| සාමූහික | 1,459 | 2,115 | 2,475 | 3,720 | 4,162 | 3,274 | 3,470 | 3,329 | 3,425 |
| **දේපොල මත බදු** | **282** | **322** | **397** | **489** | **499** | **648** | **1,563** | **1,568** | **1,553** |
| **භාණ්ඩ හා සේවා මත බදු** | **4,866** | **6,320** | **8,710** | **10,888** | **13,359** | **14,787** | **16,156** | **15,667** | **18,707** |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 2,829 | 4,052 | 6,224 | 8,143 | 10,189 | 10,088 | 10,920 | 10,611 | 12,450 |
| නිෂ්පාදන | 1,728 | 1,806 | 2,718 | 3,045 | 3,768 | 3,270 | 4,010 | 3,675 | 3,740 |
| නිෂ්පාදන නොවන | 1,101 | 1,524 | 1,891 | 1,928 | 2,590 | 2,415 | 2,760 | 2,426 | 2,910 |
| ආනයන | — | 722 | 1,615 | 3,170 | 3,831 | 4,403 | 4,150 | 4,510 | 5,800 |
| සුරාබදු | 1,942 | 2,123 | 2,298 | 2,551 | 2,982 | 4,414 | 4,996 | 4,716 | 5,922 |
| මත්පැන් | 749 | 808 | 867 | 1,013 | 1,104 | 1,485 | 1,695 | 1,644 | 2,040 |
| දුම්කොළ | 1,123 | 1,315 | 1,431 | 1,537 | 1,877 | 2,927 | 3,300 | 3,071 | 3,880 |
| බලපත්‍ර ගාස්තු | 95 | 145 | 188 | 194 | 188 | 285 | 240 | 340 | 335 |
| **ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු** | **6,519** | **5,172** | **7,439** | **13,082** | **10,998** | **11,050** | **12,880** | **12,983** | **14,660** |
| ආනයන[1] | 2,725 | 2,538 | 4,047 | 6,670 | 8,093 | 9,414 | 11,140 | 11,059 | 12,445 |
| අපනයන | 3,771 | 2,634 | 3,392 | 6,412 | 2,905 | 1,636 | 1,740 | 1,924 | 2,215 |
| තේ | 1,965 | 1,594 | 2,222 | 5,004 | 2,214 | 996 | 955 | 1,152 | 1,305 |
| ඉන් : වටිනාකම අනුව | 86 | 150 | 932 | 3,236 | 1,032 | 62 | 60 | 262 | 550 |
| රබර් | 1,433 | 753 | 852 | 1,009 | 254 | 307 | 520 | 530 | 725 |
| පොල් | 241 | 191 | 241 | 297 | 342 | 232 | 140 | 148 | 110 |
| අනෙකුත් අපනයන | 132 | 96 | 77 | 102 | 95 | 101 | 125 | 94 | 75 |
| **බදු නොවන ආදායම** | **1,079** | **1,473** | **3,405** | **4,122** | **5,807** | **5,966** | **5,827** | **7,028** | **6,440** |
| දේපොල ආදායම් | 584 | 777 | 2,606 | 3,085 | 3,926 | 4,731 | 4,025 | 4,541 | 4,556 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | — | — | 1,500 | 1,650 | 1,500 | 1,779 | 1,750 | 1,723 | 1,650 |
| පොළී ආදායම් | 168 | 243 | 492 | 1,783 | 3,274 | 2,860 | 2,018 | 2,364 | 2,070 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්ත | 262 | 327 | 356 | 692 | 666 | 803 | 1,098 | 1,229 | 1,638 |
| සේවා සහ ගාස්තු | 147 | 186 | 202 | 265 | 364 | 347 | 353 | 334 | 460 |
| අනෙකුත් බදු නොවන ආදායම්[2] | 348 | 510 | 597 | 772 | 1,517 | 888 | 1,449 | 2,153 | 1,424 |
| මුළු ආදායම | 14,775 | 16,210 | 23,317 | 34,061 | 36,249 | 37,238 | 41,531 | 42,155 | 46,225 |

1. ආනයන බදු ප්‍රතිදානයන් හැර
2. ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් ඇතුළත්ය.

(අනෙක් පිට හා සම්බන්ධයි.)

## 1 . 42 සංඛ්‍යා සටහන හා සම්බන්ධයි

### රජයේ ආදයම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1981 | 1982 | 1983 | 1984 | 1985 | 1986 | 1987 අනුමත කළ ඇස්තමේන්තු | 1987 තාවකාලික | 1988 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **බදු ආදයම** .. | **16·1** | **14·9** | **16·4** | **19·5** | **18·7** | **17·4** | **17·4** | **17·9** | **17·6** |
| **ආදයම් බදු** .. | **2·4** | **2·9** | **2·8** | **3·6** | **3·4** | **2·7** | **2·5** | **2·5** | **2·1** |
| පුද්ගලික .. | 0·7 | 0·8 | 0·7 | 1·1 | 0·9 | 0·8 | 0·8 | 0·8 | 0·6 |
| සාමූහික .. | 1·7 | 2·1 | 2·0 | 2·4 | 2·6 | 1·8 | 1·7 | 1·7 | 1·5 |
| **දේපොල මත බදු** .. | **0·3** | **0·3** | **0·3** | **0·3** | **0·3** | **0·4** | **0·8** | **0·8** | **0·7** |
| **භාණ්ඩ හා සේවා මත බදු** .. | **5·7** | **6·4** | **7·2** | **7·1** | **8·2** | **8·2** | **7·9** | **8·0** | **8·3** |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු .. | 3·3 | 4·1 | 5·1 | 5·3 | 6·3 | 5·6 | 5·3 | 5·4 | 5·5 |
| නිෂ්පාදන .. | 2·0 | 1·8 | 2·2 | 2·0 | 2·3 | 1·8 | 2·0 | 1·9 | 1·7 |
| නිෂ්පාදන නොවන .. | 1·3 | 1·5 | 1·6 | 1·3 | 1·6 | 1·3 | 1·3 | 1·2 | 1·3 |
| ආනයන .. | — | 0·7 | 1·3 | 2·1 | 2·4 | 2·5 | 2·0 | 2·3 | 2·6 |
| සුරාබදු .. | 2·3 | 2·1 | 1·9 | 1·7 | 1·8 | 2·5 | 2·4 | 2·4 | 2·6 |
| මත්පැන් .. | 0·9 | 0·8 | 0·7 | 0·7 | 0·7 | 0·8 | 0·8 | 0·8 | 0·9 |
| දුම්කොළ .. | 1·3 | 1·3 | 1·2 | 1·0 | 1·2 | 1·6 | 1·6 | 1·6 | 1·7 |
| බලපත්‍ර ගාස්තු .. | 0·1 | 0·1 | 0·2 | 0·1 | 0·1 | 0·2 | 0·1 | 0·2 | 0·1 |
| **ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු** .. | **7·7** | **5·2** | **6·1** | **8·5** | **6·8** | **6·2** | **6·3** | **6·6** | **6·5** |
| ආනයන .. | 3·2 | 2·6 | 3·3 | 4·3 | 5·0 | 5·2 | 5·4 | 5·6 | 5·5 |
| අපනයන .. | 4·4 | 2·7 | 2·8 | 4·2 | 1·8 | 0·9 | 0·8 | 1·0 | 1·0 |
| තේ .. | 2·3 | 1·6 | 1·8 | 3·3 | 1·4 | 0·6 | 0·5 | 0·6 | 0·6 |
| ඉන්: වටිනාකම අනුව .. | 0·1 | 0·2 | 0·8 | 2·1 | 0·6 | ... | ... | 0·1 | 0·2 |
| රබර් .. | 1·7 | 0·8 | 0·7 | 0·7 | 0·2 | 0·2 | 0·3 | 0·3 | 0·3 |
| පොල් .. | 0·3 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·1 | 0·1 | 0·1 | ... |
| අනෙකුත් අපනයන .. | 0·2 | 0·1 | 0·1 | 0·1 | 0·1 | 0·1 | 0·1 | 0·2 | ... |
| **බදු නොවන ආදයම** .. | **1·3** | **1·5** | **2·8** | **2·7** | **3·6** | **3·3** | **2·8** | **3·6** | **2·8** |
| දේපොල ආදයම .. | 0·7 | 0·8 | 2·1 | 2·0 | 2·4 | 2·6 | 2·0 | 2·3 | 2·0 |
| ඉන්: මහ බැංකුවේ ලාභ .. | — | — | 1·2 | 1·1 | 0·9 | 1·0 | 0·9 | 0·9 | 0·7 |
| පොලී ආදයම් .. | 0·2 | 0·2 | 0·4 | 1·2 | 2·0 | 1·6 | 1·0 | 1·2 | 0·9 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්ත .. | 0·3 | 0·3 | 0·3 | 0·5 | 0·4 | 0·4 | 0·5 | 0·6 | 0·7 |
| සේවා හා ගාස්තු .. | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| අනෙකුත් බදු නොවන ආදයම් .. | 0·4 | 0·5 | 0·5 | 0·5 | 0·9 | 0·5 | 0·7 | 1·1 | 0·6 |
| මුළු ආදයම .. | 17·4 | 16·3 | 19·2 | 22·2 | 22·3 | 20·8 | 20·3 | 21·4 | 20·4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 දී රාජ්‍ය සංස්ථා සඳහා කළ මුළු වර්තන පැවරුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,286 ක් විය. මෙය පසුගිය වසරට වඩා සියයට 3 ක අඩු වීමකි. රාජ්‍ය සංස්ථා සඳහා කළ පැවරුම් 1987 මුළු වර්තන වියදමින් පහෙන් එකක් පමණ වුවද, ඉන් සමහරක් ලාභ ඉපයීම අරමුණු කර නොගත් රාජ්‍ය ආයතනයන්හි මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා විය. මේ අතර තැපැල් හා දුම්රිය වැනි වෙළෙඳ ව්‍යවසායයන් මෙහෙයුම් අලාභ ලැබීම නිසා රජයේ ආධාර තවදුරටත් අවශ්‍ය විය. මෙම ව්‍යවසායයන් දෙකෙහි මෙහෙයුම් අලාභ රුපියල් දශ ලක්ෂ 458 ක් වූ අතර 1986 දී රුපියල් දශ ලක්ෂ 414 ක් විය.

1987 දී රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 10,159 ක් විය. මෙය ඉකුත් වසරේ පැවැති රුපියල් දශ ලක්ෂ 8,762 ක ගෙවීමට වඩා සියයට 16 ක වැඩි වීමකි. රුපියල් දශ ලක්ෂ 7,595 ක් වූ දේශීය ණය සඳහා පොළී ගෙවීම් සියයට 16 කින් වැඩි වූ අතර, විදේශීය ණය සඳහා වූ පොළී රුපියල් දශ ලක්ෂ 2,564 ක්ව සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 1987 රාජ්‍ය ණය සඳහා මුළු පොළී ගෙවීම් වලින් හතරෙන් තුනක් පමණ වූ දේශීය ණය පොළී ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 4,499 ක් රුපියල් ණය සඳහාද, රුපියල් දශ ලක්ෂ 3,092 ක් භාණ්ඩාගාර බිල්පත් සඳහාද, රුපියල් දශ ලක්ෂ 4 ක් පරිපාලන ණය සඳහාද විය. 1987 රුපියල් ණය සඳහා පොළී ගෙවීම සියයට 8 කින් ඉහළ ගිය අතර, මූලික වශයෙන් නොපියවූ වගකීම් වැඩි වීමේ හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් මත වූ පොළී ගෙවීම් සියයට 19 කින් වැඩි විය. විදේශීය ණය සඳහා වූ මුළු පොළී ගෙවීම්වල, වෙළෙඳ ණය සඳහා ගෙවිය යුතු වූ රුපියල් දශ ලක්ෂ 757 ක් අඩංගු විය. 1986 දී එම ගෙවීම රුපියල් දශ ලක්ෂ 801 ක්ව පැවතුණි.

ඉකුත් සත් වසර සඳහා සංසන්දනාත්මක දත්තයන් සමග 1987 වර්ෂයේ රජයේ වියදම් පිළිබඳ සාරාංශයක් 1.43 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**ප්‍රාග්ධන වියදම**

1987 දී ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 22,969 ක් විය. මෙය ඉකුත් වසරට වඩා සියයට 1 ක පහත වැටීමකි. එසේම දළ දේශීය නිෂ්පාදිතයෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධන වියදම 1986 සියයට 13 සිට 1987 දී සියයට 11.7 දක්වා පහත වැටුණි. වර්ෂය තුළ ආරක්ෂක කටයුතු සඳහා වූ වියදම් වැඩිවීම පියවා ගැනීමට කරන ලද ප්‍රාග්ධන වියදම් කපා හැරීම මෙම අඩු වීමට බෙහෙවින් හේතු විය.

ස්ථාවර වත්කම් අත්කර ගැනීම, ඉදි කිරීම සහ නඩත්තු කිරීම සඳහා රජය විසින් කරන ලද වියදම මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 47 ක් වූ අතර, රාජ්‍ය සංස්ථාවලට කරන ලද ප්‍රාග්ධන පැවරුම් ප්‍රමාණය සියයට 49 ක් විය. පසුගිය වර්ෂයේ රාජ්‍ය සංස්ථා සඳහා කළ ප්‍රාග්ධන පැවරුම් ප්‍රමාණය මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 64 ක් විය.

1987 දී ස්ථාවර වත්කම් අත්කර ගැනීම, ඉදි කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ රුපියල් දශ ලක්ෂ 10,828 ක ප්‍රාග්ධන වියදම පසුගිය වසරේ වියදමට වඩා සියයට 39 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ රුපියල් දශ ලක්ෂ 2,098 ක් වූ ප්‍රාග්ධන වියදම සියයට 55 ක විශාල වැඩි වීමක් පෙන්නුම් කර ඇත. මේ අතුරින් ප්‍රධාන වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතීන්, ගුරුත්ව වාරිමාර්ග කටයුතු ඉදි කිරීම හා වැඩි දියුණු කිරීම, ඉඩම් පිළියෙල කිරීම, නිවාස සහ මහා මාර්ග ඉදි කිරීම සඳහා දරන ලද වියදම රුපියල් දශ ලක්ෂ 1,599 ක් වූ අතර 1986 වියදම වූ රුපියල් දශ ලක්ෂ 1,003 සමග සසඳන විට විශාල වැඩි වීමකි. මේ අතර, පසුගිය වසරේ රුපියල් දශ ලක්ෂ 278 ක් වූ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ප්‍රාග්ධන වියදම 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 718 දක්වා වැඩි විය. කෘෂිකාර්මික සංවර්ධනය සැළසුම් කිරීම, වැඩ සටහන් සම්පාදනය සහ ප්‍රගති පාලනය සඳහා දරන ලද රුපියල් දශ ලක්ෂ 444 ක්ද මෙහි ඇතුළත් වේ.

## 1 . 43 සංඛ්‍යා සටහන

### වියදමෙහි ආර්ථික වර්ගීකරණය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1981 | 1982 | 1983 | 1984 | 1985 | 1986 | 1987 අනුමත කළ ඇස්තමේන්තු | 1987 තාවකාලික | 1988 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** .. | **14,649** | **18,341** | **22,002** | **24,630** | **32,645** | **33,967** | **36,954** | **38,713** | **40,548** |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම .. | 5,224 | 6,500 | 7,848 | 9,195 | 16,287 | 15,155 | 18,366 | 17,640 | 19,129 |
| වැටුප් සහ වේතන .. | 3,579 | 4,561 | 4,811 | 5,554 | 6,878 | 8,028 | 8,278 | 7,986 | 10,001 |
| වෙනත් භාණ්ඩ හා සේවා .. | 1,645 | 1,940 | 3,037 | 3,642 | 9,409 | 7,127 | 10,088 | 9,654 | 9,128 |
| පොළී ගෙවීම් .. | 3,738 | 5,104 | 6,606 | 6,738 | 7,428 | 8,762 | 10,220 | 10,159 | 11,962 |
| විදේශීය .. | 713 | 915 | 1,270 | 1,623 | 1,970 | 2,209 | 2,420 | 2,564 | 3,199 |
| දේශීය .. | 3,025 | 4,189 | 5,336 | 5,115 | 5,458 | 6,553 | 7,800 | 7,595 | 8,763 |
| සංක්‍රාම ගෙවීම් .. | 5,687 | 6,736 | 7,548 | 8,697 | 8,929 | 10,050 | 10,286 | 10,914 | 10,497 |
| රාජ්‍ය ව්‍යවසායයන් .. | 557 | 1,232 | 1,768 | 1,762 | 882 | 2,350 | 2,229 | 2,286 | 1,736 |
| වෙනත් රාජ්‍ය ආයතන .. | 182 | 317 | 388 | 444 | 501 | 600 | 641 | 641 | 833 |
| කුටුම්භයන් .. | 4,948 | 5,187 | 5,392 | 6,491 | 7,546 | 7,100 | 7,416 | 7,987 | 7,928 |
| **ප්‍රාග්ධන වියදම** .. | **11,252** | **15,427** | **15,863** | **19,915** | **21,530** | **23,236** | **23,351** | **22,969** | **27,017** |
| මූර්ත වත්කම් අත්කර ගැනීම, ඉදි කිරීම සහ නඩත්තු කිරීම .. | 4,026 | 4,829 | 5,375 | 5,849 | 7,375 | 7,788 | 12,051 | 10,828 | 15,532 |
| ප්‍රාග්ධන පැවරුම් .. | 7,226 | 10,598 | 10,488 | 14,066 | 14,155 | 15,448 | 11,331 | 12,141 | 11,489 |
| රාජ්‍ය ව්‍යවසායයන් .. | 7,073 | 10,591 | 10,422 | 13,681 | 13,441 | 14,874 | 10,521 | 11,301 | 10,729 |
| වෙනත් රාජ්‍ය ආයතන .. | 149 | 167 | 317 | 198 | 481 | 472 | 702 | 732 | 672 |
| වෙනත් .. | 23 | 15 | 11 | 44 | 26 | 101 | 108 | 108 | 88 |
| අනෙකුත් .. | - 19 | - 176 | - 262 | 143 | 207 | — | — | — | 2 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම්** .. | **2,113** | **- 256** | **1,772** | **3,292** | **1,059** | **1,991** | **2,019** | **1,377** | **4,969** |
| අත්තිකාරම් ගිණුම .. | 1,716 | - 879 | 1,120 | 2,917 | 314 | - 170 | 250 | - 1,180 | 100 |
| රාජ්‍ය සංස්ථා සඳහා ණයදීම් .. | 569 | 720 | 801 | 901 | 997 | 2,669 | 2,204 | 3,018 | 5,324 |
| ණය ආපසු ගෙවීම් .. | - 172 | - 97 | - 149 | - 526 | - 252 | - 508 | - 435 | - 461 | - 455 |
| මුළු වියදම සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම් .. | 28,014 | 33,512 | 39,637 | 47,837 | 55,234 | 59,194 | 62,324 | 63,059 | 72,534 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කළ රුපියල් දශ ලක්ෂ 565 ක් වූ ආයෝජනය 1986 ට වඩා සුළු අඩු වීමකි. මෙයින් රුපියල් දශ ලක්ෂ 515 වැය කරන ලද්දේ සාමාන්‍ය සහ ගුරු අධ්‍යාපනය සඳහා ගොඩනැගිලි ඉදි කිරීම සඳහාය. මේ අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වූ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 425 ක් විය. 1986 දී මෙය රුපියල් දශ ලක්ෂ 620 ක් විය. මේ අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ ප්‍රාග්ධන වියදම, 1986 රුපියල් දශ ලක්ෂ 539 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 1,093 දක්වා වැඩි විය. තවද, වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් අමාත්‍යාංශය යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 1986 වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 105 සිට 1987 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 201 දක්වා වැඩි විය.

අධිකරණ අමාත්‍යාංශය යටතේ ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා වූ ප්‍රාග්ධන වියදම 1986 දී රුපියල් දශ ලක්ෂ 228 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 377 දක්වා වැඩි විය. ඒ අතර තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම රුපියල් දශ ලක්ෂ 949 ක් වූ අතර, 1986 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 630 ක් විය. කොළඹින් පිට පළාත් සංවර්ධන යෝජනා ක්‍රම, ග්‍රාමීය ප්‍රදේශවලට ගුවන් විදුලි සම්බන්ධතා සැපයීම සහ කොළඹ ප්‍රදේශය සංවර්ධන කිරීමේ යෝජනා ක්‍රමය මෙම ප්‍රාග්ධන වියදම් යොමුකළ ප්‍රධාන ව්‍යාපෘති විය. මෙම ව්‍යාපෘතීන් සඳහා 1987 දී රුපියල් දශ ලක්ෂ 686 ක් වැය කළ අතර, 1986 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 294 ක් විය.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල, විමධ්‍යගත අයවැය සහ දිසා සංවර්ධන සභා මගින් දිස්ත්‍රික් මට්ටමින් දරූ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 1,211 ක් වූ අතර පසුගිය වසරේ එම වියදම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,268 ක් විය.

රාජ්‍ය සංස්ථා සඳහා කළ ප්‍රාග්ධන පැවරුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,301 ක් වූ අතර එය 1986 වර්ෂයට වඩා සියයට 24 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. මුළු ප්‍රාග්ධන පැවරුමෙන් රුපියල් දශ ලක්ෂ 8,909 ක් හෙවත් පහෙන් හතරක ප්‍රමාණයක් මහවැලි සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම, මාර්ග සංවර්ධන අධිකාරිය සහ එයාර් ලංකා ගුවන් සමාගම විසින් ලබා ගනු ලැබීන.

පසුගිය වර්ෂවලදී මෙන්ම, මහවැලි සංවර්ධන අධිකාරියට දෙනු ලැබූ ප්‍රාග්ධන පැවරුම් ප්‍රමාණය මුළු ප්‍රාග්ධන පැවරුම් වලින් වැඩි ප්‍රමාණයක් විය. මේ අනුව, මහවැලි සංවර්ධන අධිකාරිය විසින් රුපියල් දශ ලක්ෂ 5,087 ක් හෙවත් 1987 මුළු ප්‍රාග්ධන පැවරුමෙන් සියයට 45 ක් වියදම් කොට ඇත. කෙසේ වුවද, මෙය 1986 දී වැය කරන ලද ප්‍රමාණයට වඩා සියයට 15 ක අඩු වීමකි. 1987 වසරේදී දෙවැනි විශාලතම ප්‍රාග්ධන පැවරුම් ලැබූ ආයතනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විය. මෙම මණ්ඩලයට කරන ලද මුළු ප්‍රාග්ධන පැවරුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,234 ක් වූ අතර, ඉකුත් වසරේ එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 994 ක් විය. සී/ස ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගම සඳහා වූ ප්‍රාග්ධන පැවරුම් 1986 දී රුපියල් දශ ලක්ෂ 1,423 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 911 දක්වා පහත වැටුණු අතර, මාර්ග සංවර්ධන අධිකාරියට කරන ලද ප්‍රාග්ධන පැවරුම් රුපියල් දශ ලක්ෂ 876 සිට රුපියල් දශ ලක්ෂ 784 දක්වා පහත වැටුණි. මේ අතර ජාතික ගුවන් සේවය වන එයාර් ලංකා ආයතනයට කරන ලද ප්‍රාග්ධන දායකත්වය 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 2,403 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 893 දක්වා තියුණු ලෙසින් අඩු විය. මේ අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා රුපියල් දශ ලක්ෂ 374 ක් ද, ජාතික තරුණ සේවා සභාව සඳහා රුපියල් දශ ලක්ෂ 394 ක මුදලක්ද 1987 වසරේදී යොදවන ලදී.

**ආපසු ගෙවීම් අඩු කළ පසු ණයදීම්**

1987 වසරේදී රජයේ ආපසු ගෙවීම් අඩු කළ පසු වූ ණය දීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,377 ක් වූ අතර, 1986 එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,991 ක් විය. අත්තිකාරම් ගිණුම් කටයුතු වලින් රුපියල් දශ ලක්ෂ 1,180 ක ශුද්ධ අතිරික්තයක් ඇති වූ අතර, රාජ්‍ය සංස්ථාවන් වෙත ණය

වශයෙන් සපයන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,018 ක් විය. 1987 වර්ෂයේදී රජයට කරන ලද ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 461 ක් වූ අතර, එය 1986 වසරේදී රුපියල් දශ ලක්ෂ 508 ක් විය.

රජයේ දෙපාර්තමේන්තුවලට අදාළ අත්තිකාරම් ගිණුම් කටයුතු වෙතින් 1986 වර්ෂයේ ඇති වූ රුපියල් දශ ලක්ෂ 221 ක ශුද්ධ ගෙවීමට ප්‍රතිමුඛව රුපියල් දශ ලක්ෂ 903 ක ශුද්ධ ලැබීමක් 1987 වර්ෂයේ ඇති විය. මීට ප්‍රධාන හේතුව වූයේ ආහාර මිළදී ගැනීමේ හා බෙදා හැරීමේ ගිණුමේ ඇති වූ රුපියල් දශ ලක්ෂ 1,162 ක අතිරික්තයයි. ඉකුත් වසරේ මෙම ගිණුමේ අතිරික්තය රුපියල් දශ ලක්ෂ 366 ක් විය. මේ අතර ගබඩා හා ද්‍රව්‍ය ගිණුමේ 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 230 ක අතිරික්තයක් ඇති කරන ලදී. පසුගිය වසරේ මෙම ගිණුමේ රුපියල් දශ ලක්ෂ 219 ක ශුද්ධ ගෙවීමක් දක්නට ලැබුණි.

රාජ්‍ය සංස්ථාවන්ට ණය වශයෙන් සපයන ලද මුළු මූල්‍ය සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,018 ක් විය. මෙයින් රුපියල් දශ ලක්ෂ 1,919 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයේ සමනල වැව සහ රන්ටැඹේ විදුලි බල ව්‍යාපෘතීන්හි සංවර්ධන කටයුතු සඳහා සහ විකාශණය හා බෙදා හැරීමේ ව්‍යාපෘතීන් කීපයක් වෙනුවෙන්ද ලබාදෙන ලදී. මේ සඳහා වූ මුදල් ප්‍රමාණය විදේශ ප්‍රභවයන්ගෙන් ලැබුණි.

**අයවැය හිඟය පියවීම**

1987 දී අයවැය කටයුතු වලින් රුපියල් දශ ලක්ෂ 16,380 ක අයවැය හිඟයක් (දීමනාවලට පසු) ඇති විය. ඒ මූලික ඇස්තමේන්තුවලට අනුව 1987 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය හිඟය වූයේ රුපියල් දශ ලක්ෂ 16,697 කි. ඉකුත් වසරේ අයවැය කටයුතු වලින් රුපියල් දශ ලක්ෂ 18,203 ක අයවැය හිඟයක් ඇති විය. කෙසේ වුවද, 1987 වර්ෂයේ ඇති වූ අයවැය හිඟය, විදේශ ණය මගින් හා බැංකු නොවන මාර්ගයන්ගෙන් ලබාගත් සම්පත් ප්‍රමාණය ඉක්මවිය. මේ අනුව මුලින් අපේක්ෂා කළ පරිදි අයවැය හිඟය පියවීම සඳහා රුපියල් දශ ලක්ෂ 3,541 ක ප්‍රමාණයක් බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ලදී. 1986 වර්ෂයේදී බැංකු මූලයන්ගෙන් ලබාගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,047 ක් විය.

ඉකුත් වසරට වඩා සියයට 37 ක අඩු වීමක් පිළිබිඹු කළ, රුපියල් දශ ලක්ෂ 5,716 ක් වූ ශුද්ධ විදේශ ණය මගින් 1987 වසරේ සමස්ත අයවැය හිඟයෙන් සියයට 35 ක් පියවන ලදී. 1986 වසරේදී එම ප්‍රමාණය සියයට 50 ක් විය. මූලික අයවැය ඇස්තමේන්තුවලින් අපේක්ෂා කළ ශුද්ධ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,649 ක් විය. 1987 වර්ෂයේදී අයවැය කටයුතු සඳහා අඩු ප්‍රමාණයක විදේශ ණය උපයෝජනයක් අපේක්ෂා කරන ලද නමුත් අපේක්ෂිත ප්‍රමාණයටත් වඩා වැඩි ප්‍රමාණයකින් විදේශීය ණය උපයෝජනය අඩු විය. වසර තුළදී බලපැවැත්වූ වියදම් කපා හැරීමේ ක්‍රියාවලිය මෙයට බලපෑ එක් හේතුවක් වූවා විය හැකිය.

1987 වසරෙහි වෙළෙඳපොල නොවන ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 724 ක් වූ අතර, වෙළෙඳපොල ණය ගැණුම් රුපියල් දශ ලක්ෂ 9,940 ක් විය. 1986 වසරේ මට්ටමේම පැවති වෙළෙඳපොල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 6,399 ක් බැංකු නොවන මූලයන්ගෙන් හා රුපියල් දශ ලක්ෂ 3,541 ක් බැංකු මූලයන්ගෙන් සමන්විත විය. බැංකු නොවන මූලයන්ගෙන් ලබාගත් දේශීය වෙළෙඳපොල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 6,117 ක් රුපියල් සුරකුම්වලින් හා රුපියල් දශ ලක්ෂ 282 ක් භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත විය. ඍජු පාලනයට හසු නොවන මූලයන්ගෙන් ලත් සම්පත් 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 276 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 676 දක්වා ඉහළ ගිය නමුදු, රුපියල් සුරකුම් සඳහා කෙරුනු දායකත්වයන්ගෙන් සියයට 90 ක පමණ ප්‍රමාණයක් ඍජු පාලනයට හසුවන සේවක අර්ථ සාධක අරමුදල හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලැබිණ. කෙසේවුවද, 1987 වසරේදී වෙළෙඳපොල බැංකු නොවන මූලයන්ගෙන් ලැබූ ණය ප්‍රමාණය 1986 වසරට වඩා සියයට 5 කින් අඩු විය.

රුපියල් දශ ලක්ෂ 16,380 ක් වූ අයවැය හිඟයෙන් රුපියල් දශ ලක්ෂ 12,839 ක ප්‍රමාණයක් විදේශ සම්පත්, දේශීය වෙළෙඳපොල නොවන හා බැංකු නොවන මූලයන්ගෙන් පියවා ගනු ලැබිනි. එබැවින් සම්පත් හිඟය වූ රුපියල් දශ ලක්ෂ 3,541 ක ප්‍රමාණය බැංකු මූලයන්ගෙන් පියවන ලදී. මෙයින් රුපියල් දශ ලක්ෂ 3,346 ක් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබා ගන්නා ලදී. මහ බැංකු තාවකාලික අත්තිකාරම් කටයුතුවලින් රුපියල් දශ ලක්ෂ 40 ක ශුද්ධ ආපසු ගෙවීමක් ඇති විය. මීට ප්‍රතිමුඛව පසුගිය වසරේ මෙම අත්තිකාරම් කටයුතු වෙතින් රුපියල් දශ ලක්ෂ 407 ක ශුද්ධ ණය ගැනීමක් වාර්තා කරන ලදී. මේ අතර 1987 රුපියල් ණය වෙනුවෙන් බැංකු අංශය වෙත කරන ලද ශුද්ධ ණය ආපසු ගෙවීම රුපියල් දශ ලක්ෂ 7 කි. වසර තුළදී මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශ ලක්ෂ 242 ක් විය.

**රාජ්‍ය ණය**

1987 වසර අවසානයේදී නොපියවූ රජයේ ණය ප්‍රමාණය ඉකුත් වසරට වඩා සියයට 21 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 189,043 ක් විය. 1986 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 155,707 ක් විය. රුපියල් දශ ලක්ෂ 78,997 ක් වූ දේශීය ණය 1987 දී සියයට 14 ක වැඩි වීමක් පිළිබිඹු කළ අතර, රුපියල් දශ ලක්ෂ 110,046 ක් වූ විදේශීය ණය සියයට 28 ක වර්ධනයක් වාර්තා කරනු ලැබිනි. ණය හිමිකරුවන් සහ ණය උපකරණ අනුව නොපියවූ ණයවල සංයුතිය 1.44 සහ 1.45 සංඛ්‍යා සටහන්හි දක්වා ඇත.


1987 වසර අවසානයේදී මුළු ණය ප්‍රමාණයෙන් දේශීය ණය ප්‍රමාණය සියයට 42 ක් විය. මුළු දේශීය ණයවලින් නොපියවූ වෙළෙඳපොල ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 78,816 ක් විය. ඉතිරිය වෙළෙඳපොල නොවන හෙවත් පරිපාලන ණය වලින් සමන්විත විය. පසුගිය වසරේ වැඩිවූ සියයට 11 සමඟ සැසඳීමේදී මෙය සියයට 14 ක වැඩි වීමකි. ඉකුත් වසරේ මෙන්ම බැංකු නොවන අංශ වෙළෙඳපල ණය වලින් සියයට 61 කට හිමිකම් පෑ අතර, ඉතිරිය බැංකු ක්‍රමය සතු විය.

1987 වසර අවසානයේ මැදි හා දිගු කාලීන දේශීය ණය (වර්ෂයකට වැඩි) ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 45,138 ක් වූ අතර, කෙටි කාලීන ණය (වර්ෂයකට අඩු) ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 33,859 ක්ව පැවතුණි. මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණය ඉකුත් වසරට වඩා සියයට 15 කින් වැඩි වූ අතර, කෙටි කාලීන ණය සියයට 12 කින් වැඩි විය. මේ අනුව මුළු දේශීය ණයෙහි මැදි හා දිගු කාලීන ණය කොටස ඉකුත් වසරේ මෙන් සියයට 57 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

මුළු මැදි හා දිගු කාලීන දේශීය ණය ප්‍රමාණය සම්පූර්ණයෙන්ම රුපියල් සුරැකුම්පත්වලින් සමන්විත විය. වසර අවසානයේදී නොපියවූ රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 44,957 ක් වූ අතර එය සියයට 15 ක වැඩි වීමක් පෙන්නුම් කරනු ලැබිණ. පසුගිය වසරේදී එම වැඩිවීම සියයට 7 ක් විය. ඉකුත් වසරේ ලබාගත් රුපියල් දශ ලක්ෂ 7,777 සමඟ සැසඳීමේදී 1987 වසරේ රුපියල් සුරැකුම්පත් මඟින් ලබාගත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,000 ක් වූ නමුදු, වසර තුළ රුපියල් දශ ලක්ෂ 1,172 ක මුළු ණය ආපසු ගෙවීම් හේතුකොට ගෙන නොපියවූ වගකීම් ප්‍රමාණය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 5,828 කින් පමණි.

සේවක අර්ථසාධක අරමුදල (සේ. අ. අ.) සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා. ඉ. බැ.) තවදුරටත් රුපියල් ණය වැඩ පිළිවෙල සඳහා ප්‍රධාන දායකයන් විය. රුපියල් ණය සඳහා සේවක අර්ථසාධක අරමුදල කළ ආයෝජනයන් 1986 වසරේ කරන ලද ආයෝජනයන්ට වඩා සියයට 17 කින් අඩුවී රුපියල් දශ ලක්ෂ 4,228 ක් විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඉකුත් වසරට වඩා සියයට 12 ක අඩු වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 2,096 කින් දායක විය. රුපියල් සුරැකුම්පත් සඳහා අනිකුත් දායකයන්ගේ මුළු ආයෝජනයන් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 676 ක් වූ අතර, ඉකුත් වසරේදී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 276 ක් විය. ඉන් වැඩි ප්‍රමාණයක් අනෙකුත් අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල් වෙතින් ලැබී ඇත.

# රාජ්‍ය ණය සංයුතිය




* දළ රාජ්‍ය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.


## 1 . 44 සංඛ්‍යා සටහන

## නොපියවූ රාජ්‍ය ණය – හිමිකරුවන් අනුව

| ශීර්ෂය | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | | නොපියවූ ණය වෙනස්වීමේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986 | 1987 | 1984 | 1985 | 1986 | 1987 |
| 1. දේශීය .. .. | 51,651 | 62,611 | 69,499 | 78,997 | - 0·2 | 21·2 | 11·0 | 13·7 |
| 1·1 වෙළෙඳපොල .. .. | 51,555 | 62,492 | 69,352 | 78,816 | - ... | 21·2 | 11·0 | 13·6 |
| 1·1·1 බැංකු-නොවන .. .. | 33,783 | 37,338 | 42,159 | 48,312 | 9·0 | 10·5 | 12·9 | 14·6 |
| 1·1·2 බැංකු .. .. | 17,772 | 25,154 | 27,193 | 30,504 | - 13·6 | 41·5 | 8·1 | 12·2 |
| 1·2 වෙළෙඳපොල නොවන .. .. | 96 | 119 | 147 | 181 | - 51·0 | 23·3 | 24·0 | 22·8 |
| 2. විදේශීය .. ... | 53,680 | 67,673 | 86,208 | 110,046 | 16·6 | 26·1 | 27·4 | 27·7 |
| 2·1 බහු පාර්ශ්වීය .. .. | 16,131 | 19,512 | 23,983 | 30,208 | 25·7 | 21·0 | 22·9 | 26·0 |
| 2·2 ද්වි පාර්ශ්වීය .. .. | 30,181 | 39,956 | 53,176 | 71,587 | 9·5 | 32·4 | 33·1 | 34·6 |
| 2·3 මූල්‍ය වෙළෙඳපොල .. .. | 7,369 | 8,205 | 9,049 | 8,251 | 31·1 | 11·3 | 10·3 | - 8·9 |
| එකතුව .. .. | 105,332 | 130,284 | 155,707 | 189,043 | 7·7 | 23·7 | 19·5 | 21·4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.


# දේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දළ දේශීය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

# විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

# 1 . 45 සංඛ්‍යා සටහන

## රාජ්‍ය ණය මාධ්‍යයන් අනුව

| ශීර්ෂය | නොපියවූ ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | | නොපියවූ ණය වෙනස්වීමේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986 | 1987 | 1984 | 1985 | 1986 | 1987 |
| 1. දේශීය ණය .. | 51,651 | 62,611 | 69,499 | 78,997 | – 0·2 | 21·2 | 11·0 | 13·7 |
| 1.1 මැදි හා දිගුකාලීන ණය .. | 33,324 | 36,689 | 39,277 | 45,138 | 3·7 | 10·1 | 7·1 | 14·9 |
| 1.1.1 රුපියල් ණය .. | 33,228 | 36,570 | 39,130 | 44,957 | 4·0 | 10·1 | 7·0 | 14·9 |
| 1.1.2 පරිපාලන ණය ගැනීම් .. | 96 | 119 | 147 | 181 | – 51·0 | 23·4 | 23·9 | 22·8 |
| 1.2 කෙටිකාලීන ණය .. | 18,328 | 25,922 | 30,222 | 33,859 | – 6·6 | 41·4 | 16·6 | 12·0 |
| 1.2.1 භාණ්ඩාගාර බිල්පත් .. | 14,860 | 22,280 | 26,173 | 29,850 | – 14·6 | 49·9 | 17·5 | 14·1 |
| 1.2.2 බදු සංචිත සහතික පත් .. | 10 | 9 | 9 | 9 | – 3·0 | – 2·1 | – 3·2 | – 2·1 |
| 1.2.3 මහ බැංකු අත්තිකාරම් .. | 3,458 | 3,633 | 4,040 | 4,000 | 56·5 | 5·1 | 11·2 | – 1·0 |
| 2. විදේශීය ණය .. | 53,681 | 67,673 | 86,208 | 110,046 | 16·6 | 26·1 | 27·4 | 27·7 |
| 2.1 ව්‍යාපෘති ණය .. | 25,971 | 36,406 | 50,418 | 68,843 | 33·0 | 40·2 | 38·5 | 36·5 |
| 2.2 භාණ්ඩ ණය .. | 18,426 | 22,373 | 27,766 | 34,995 | 3·0 | 21·4 | 24·1 | 26·0 |
| 2.3 අනෙකුත් .. | 9,284 | 8,894 | 8,024 | 6,208 | 7·9 | – 4·2 | – 9·8 | – 22·6 |
| එකතුව .. | 105,332 | 130,284 | 155,707 | 189,043 | 7·7 | 23·7 | 19·5 | 21·4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

කෙටි කාලීන ණය ලබා ගැනීමේ ප්‍රධාන උපකරණය ලෙස භාණ්ඩාගාර බිල්පත් මගින් රුපියල් දශ ලක්ෂ 3,677 ක් ලබාගත් අතර, 1986 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,893 ක් විය. මේ අනුව වසර අවසානයේදී භාණ්ඩාගාර බිල්පත් සඳහා නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 29,850 ක් දක්වා වැඩි විය.

1987 වසර තුළදී රජයට සපයන ලද ශ්‍රී ලංකා මහ බැංකු තාවකාලික අත්තිකාරම් ගණුදෙනු වෙතින් රුපියල් දශ ලක්ෂ 40 ක ශුද්ධ ආපසු ගෙවීමක් ඇතිවූ අතර, ඉකුත් වසරේදී එය රුපියල් දශ ලක්ෂ 407 ක ණය ගැනීමක් විය. ඒ අනුව 1987 වසර අවසානයේදී මෙම ගිණුම යටතේ නොපියවන ලද වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,000 ක් වූ අතර, ඉකුත් වසරේදී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,040 ක් විය.

වසර අවසානයේ නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 110,046 ක් වූ අතර, එය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 58 ක් විය. මෙය 1986 වසරේ වැඩිවූ සියයට 27 ක ප්‍රමාණය සමඟ සැසඳීමේදී සියයට 28 ක වැඩි වීමකි. වසර තුළ අයවැය කටයුතු සඳහා ලබාගත් ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,632 ක් වූ නමුත්, වසර අවසානයේ සිදුවූ විනිමය අනුපාතිකය වෙනස් වීමේ හේතුවෙන් රුපියල් දශ ලක්ෂ 18,205 ක අතිරේක වගකීමක්ද විය. ඉකුත් වසරේදී එම වැඩි වීම රුපියල් දශ ලක්ෂ 9,543 ක් විය. මේ අනුව වසර අවසානයේදී නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23,837 ක වැඩි වීමක් පෙන්වනු ලැබිනි. පසුගිය වසරේ අවසානය වනවිට නොපියවූ මුළු විදේශීය ණයවලින් රුපියල් දශ ලක්ෂ 30,208 ක් හෙවත් සියයට 27 ක ප්‍රමාණය බහුපාර්ශ්වීය ආයතන වෙතින් ලබාගෙන ඇති අතර, ඉකුත් වසරේදී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23,983 ක් හෙවත් සියයට 28 ක් විය. 1986 වසරේ රුපියල් දශ ලක්ෂ 53,176 ක් වූ නොපියවූ ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය 1987 වසරේ රුපියල් දශ ලක්ෂ 71,587 දක්වා ඉහළ ගිය අතර, මුදල් වෙළෙඳපොළවල එම ණය ප්‍රමාණය 1986 වසරේ රුපියල් දශ ලක්ෂ 9,049 සිට 1987 වසරේ රුපියල් දශ ලක්ෂ 8,251 දක්වා පහළ වැටුණි. බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය ප්‍රභවයන්ගෙන් ලබාගත හැකි සහනදායී විදේශීය ණය මත දැඩි ලෙස රඳා පැවතීමේ රජයේ ප්‍රතිපත්තිය මින් පිළිබිඹු විය.

නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 68,843 ක් ව්‍යාපෘති ණය හා රුපියල් දශ ලක්ෂ 41,203 ක් ව්‍යාපෘති නොවන ණයවලින් සමන්විත විය. වසර තුළ ශුද්ධ ව්‍යාපෘති ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,595 ක් වුවද, වසර තුළ සිදුවූ විනිමය අනුපාතිකය වෙනස් වීම නිසා අමතර වගකීමක් දැරීමට සිදුවීමේ හේතුවෙන් ව්‍යාපෘති ණය සඳහා නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18,425 කින් ඉහළ නැඟුණි. මේ අතර ව්‍යාපෘති නොවන ණය යටතේ කරන ලද ගණුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධ ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,963 ක් වුවද, විනිමය අනුපාතිකයේ වෙනස් වීම නිසා රුපියල් දශ ලක්ෂ 7,376 ක අමතර වගකීමක් සිදුවීමේ හේතුවෙන් නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,413 කින් ඉහළ නැඟුණි.

**රජයේ ණය සේවාකරණය**

ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම්වලින් සමන්විත රජයේ ණය සේවාකරණ ගෙවීම් 1986 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 16,292 සිට 1987 වසරේදී රුපියල් දශ ලක්ෂ 15,752 දක්වා පහත වැටුණි. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් රජයේ ණය සේවාකරණ ගෙවීම් 1986 වසරේදී සියයට 9 සිට 1987 වසරේදී සියයට 8 දක්වා පහළ වැටුණි.

විදේශීය ණය යටතේ ණය ආපසු ගෙවීම් ප්‍රමාණය සියයට 55 ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 4,690 ක් වූ අතර, පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 16 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 2,564 ක් විය. මේ අනුව විදේශීය ණය ගැනීම් සඳහා රජයේ මුළු ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,254 ක්වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 39 ක වැඩි වීමකි.

මේ අතර රජයේ දේශීය ණය ආපසු ගෙවීම් 1986 රුපියල් දශ ලක්ෂ 4,505 සිට 1987 රුපියල් දශ ලක්ෂ 902 දක්වා පහළ වැටුන අතර, පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 6,553 සිට රුපියල් දශ ලක්ෂ 7,595 දක්වා ඉහළ නැඟුණි. මේ අනුව දේශීය ණය යටතේ මුළු සේවාකරණ ගෙවීම් ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 23 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. දේශීය ණය ආපසු ගෙවීම්හි සැළකිය යුතු අඩු වීමට හේතු වූයේ රුපියල් ණය වැඩ සටහනෙහි පිළිබිඹු වූ අසමාන කල් පිරීමේ රටාවයි.